## විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය

NERDC

# තනතුරු පුරප්පාඩු

විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය (නර්ඩ්) ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම රජයේ ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වන අතර, බහුවිධ ඉංජිනේරු පර්යේෂණ සහ නවෝත්පාදන කටයුතුවල නියැලී සිටී. දක්ෂ ඉංජිනේරුවන් 60 කට ආසන්න සංඛ්‍යාවක් සහ සහායක කාර්ය මණ්ඩලය 200 කට අධික සංඛ්‍යාවකින් යුත් කණ්ඩායමක් සමඟ, නව්‍ය තාක්ෂණයන් හඳුන්වාදීම, පර්යේෂණ ප්‍රතිඵල සාක්ෂාත් කරගැනීම සහ ජාතික සංවර්ධනය සඳහා නිෂ්පාදන සහ තාක්ෂණයන් වාණිජකරණය කිරීම සඳහා නර්ඩ් ආයතනය කැපවී සිටී.

ආයතනයේ ඉදිරි අභිවෘද්ධිය සහ ආයතනය උපායමාර්ගික දිශානතියකට ගමන්කරවීම සඳහා, නායකත්ව හැකියාවන් සහ අභියෝග භාර ගැනීමට කැමැත්තක් ඇති දක්ෂ, කාර්යශූර වෘත්තිකයන්ගෙන් පහත සඳහන් තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

# අධ්‍යක්ෂ ජනරාල් – HM 2-3

**සුදුසුකම් සහ පළපුරුද්ද**

➢ <u>බාහිර අපේක්ෂකයින් සඳහා</u>

**අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් : (පහත 01 හෝ 02)**

01. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පළමු පන්තියේ හෝ දෙවන පන්තියේ ඉහළ ශ්‍රේණියක් සහිතව වසර 4 ක ඉංජිනේරු උපාධියක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (වරලත්) හෝ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක්

**හෝ**

02. ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වසර 4 ක ඉංජිනේරු උපාධියක් සහ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් සහ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය (වරලත්).

**පළපුරුද්ද :**

ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 10 ක සහ වරලත් සාමාජිකත්වය ලැබීමෙන් පසු වසර 5 ක පළපුරුද්ද ඇතුළත්ව පළමු උපාධිය ලැබීමෙන් අනතුරුව පිළිගත් ආයතනයක වසර 20 ක පළපුරුද්ද.

➢ <u>අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා</u>

ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධණ මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ වසර පහක (05) සේවා පළපුරුද්ද

**වයස් සීමාව :** වයස අවුරුදු 30 ට නොඅඩු සහ අවුරුදු 50 ට නොවැඩි විය යුතුය.

(අභ්‍යන්තර අයදුම්කරුවන්ට සහ රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ අනෙකුත් ව්‍යවස්ථාපිත ආයතන ඇතුළු රාජ්‍ය අංශයේ දැනට සේවය කරන අයදුම්කරුවන් සඳහා ඉහත වයස් සීමාව අදාළ නොවේ.)

**වැටුප් පරිමාණය : HM 2-3 - 2025 : Rs. 173,000 - 12 × 4,850 - 231,200**

(කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක *01/2025* අනුව වැටුප් ගෙවනු ලැබේ + වෘත්තීය දීමනාව, සන්නිවේදන දීමනාව, ජීවන වියදම් දීමනාව ඇතුළුව රජයේ අනුමත දීමනා)

## වෙනත් ප්‍රතිලාභ:

- නර්ඩ් ආයතනය විසින් සේවක අර්ථසාධක අරමුදල සඳහා වැටුපෙන් 15% ක දායකත්වයක් දරනු ලබන අතර සේවකයා විසින් 10% දායකත්වයක් දැරිය යුතුය.
- නර්ඩ් ආයතනය විසින් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා වැටුපෙන් 3% ක දායකත්වයක් දරනු ලබයි.
- නර්ඩ් ආයතනයෙන් නඩත්තු කරනු ලබන අනුයුක්ත වාහනයක් හෝ රජයේ අනුමත ප්‍රවාහන දීමනාව රු.50,000/- **සහ** රජයේ චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තියට අදාළ ඉන්ධන දීමනාව
- නර්ඩ් ආයතනයේ අනුමත වෛද්‍යාධාර ක්‍රමවේදයට අනුව වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණය
- අදාළ රජයේ චක්‍රලේඛවලට අනුව අනෙකුත් රජයේ අනුමත දීමනා / වරප්‍රසාද

## අයදුම්පත් භාරගන්නා අවසන් දිනය : 2026 ඔක්තෝබර් 05

සම්පූර්ණ ජීව දත්ත ඇතුළත් අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක සහ අධ්‍යාපනික, වෘත්තීය සහ පළපුරුද්දට අදාළ සහතිකවල පිටපත් සමඟ අයදුම්පත් භාරගන්නා අවසන් දින හෝ ඊට පෙර ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් පහත ලිපිනයට එවිය යුතුය.

(අයදුම් කරන ලද තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. රාජ්‍ය අංශයේ, රාජ්‍ය සංස්ථා/ මණ්ඩල/ ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් සලකා බැලීම සඳහා අදාළ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය)

**ලේකම්**
**විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය**
**3 වන මහල, "සෙත්සිරිපාය", 1 වන අදියර**
**බත්තරමුල්ල.**
*දුරකථන* **: *011-2 879 410, 011-2 879 404***

*වෙබ් අඩවිය* **:** www.nerdc.lk